# SANNASA KIDS පුංචි අපි




**සුබ අලුත් අවුරුද්දක්**
**බනුදි යෙහන්සා සිල්වා**
වාද්දුව

## අපේ අම්මා

අපේ අම්මාගේ නම සරෝජිනී ය.
අම්මා මට ආදරෙයි. අම්මා අපට කෑම උයා දෙනවා.
අම්මා මට ලස්සන ගවුමක් අරගෙන දුන්නා.
අම්මා මට පාඩම් කියලා දෙනවා.
අපේ අම්මාට මම ආදරෙයි.

සඳුනි විජේසේකර
පැරමටා

## ලංකාව

අපි ඕස්ට්‍රේලියාවේ ජීවත් වුනාට අපේ රට ලංකාව කියලා අපේ අත්තම්මා මට කියලා දුන්නා. ලංකාව හරිම ලස්සනයි. මම ලංකාවේ අලියන්ට හුගක් කැමතියි. අපි ලංකාවට ගිය වෙලාවේ අලි බලන්න ගියා. ලංකාවේ ලස්සන දියඇලි තියෙනවා. තේ වතු හරිම ලස්සනයි. ලංකාවේ අපේ නැන්දලා මාමලා මට හරිම ආදරෙයි. මම ලොකු වුනාම ලංකාවට යන්න ආසයි.

අනුප් අමරසිංහ
පර්ත්

## දෙන්නංකො අද හොඳ ගේමක්

"ඕං එනවා අදත්
ගිමාරා මේ පැත්තට
අද ඉතිං මගෙ වැඩක්
කරගන්න එකනං බොරු
ඇවිත් පිල්කඩ උඩ
ලැග ගන්නවඃ හරි බරි ගැහී
ගන්නවඃ පෙනේරේ එලියට
පටං ගන්නවා හලන්නට
බුලත් හෙප්පුවේ තියන
අඩු වැඩිය ටික ඔක්කොම
කටේ පුරවා ගෙන
සායං කරනවඃ අගුව
වැඩක් කර ගන්න නෑ
හුම්ටි තියන්නෙපායැ මං !
ඇහුනඃද ඇහුනාද බොට
අහ අහා හලනවඃ පච
අද මං ගිමාරඃට
දෙන්නංකො හොඳ ගේමක්
හාමිනා ගියා ගෙට
දවට ගත්තා චීත්තය ඉනේ

අතට ගත්තා පං මල්ල
හෙප්පුව තිව්වා ගෙයින්

කොන්ඩෙ ගැට ගහ ගත්තා
හෙමිං මිදුලට බැස්සා
"හා.. නේ.. ගිමාරා
උඹත් ආවි හරි වෙලාවට
මහතුංගෙ කඩේ පැත්තට
යන්න කියලය් මං මේ ...
හැඹිලියෙ තියෙනවා නං
විටක් අර ගෙන හප හප
හිටිංකෝ මං එනකං
සී පදයකුත් කිය කිය
යන ගමං අක්කලෑ ගෙටත්
ගොඩ වෙන්නෝන ටිකකට
පොඩි පහේ අතමාරුවක්
කරගන්නත් තියනවා"
-අනේ බං මට බෑ
උඹ එනකං මෙතන
උඩ බලාගෙන ඉන්න
යමං එහෙනං දෙන්නඃම"
වල්පල් කතා කර කර
දෙන්නා ගියේ නෑ වැඩි දුරක්
හිටි හැටියේ හාමිනා
ගැහුවා "බ්රේක්" පාරක්

"බොලේ .. තෙල් බෝතලේ !
ගන්න අමතක උනා නේ !

හිටපංකො ඩිංගක්
මං සුරුස් ගාලා එන්නං"
"බෑ බෑ උඹ ගිහිං
බෝතලේ අරගෙන වරෙං
මාත් දැං ගෙදර යන්නං
වෙනිං දවසක එන්නං"
හිනා කට තද කර ගෙන
හාමිනා දිව්වා ගෙදර පැත්තට
චීත්තය වැලට විසි කලා
ආයත් පටං ගත්තා ගෙදර වැඩ

වි. ක. ධර්මබන්ධු
පර්ත් ඕස්ට්‍රේලියා


A home loan specialist who speaks your language.



**Vajira Karunaratna**
Personal Lender

Home loans can seem confusing enough, without being in your second language. At the Commonwealth Bank we have lenders like Vajira, who speak Sinhalese as well as English. Vajira not only knows your language, he knows your area too. Extensive local lending experience means he's got a pretty good idea about what kind of home loan might suit you best. And you'll usually have a decision in 24 hours.

So call **Vajira** on **0401 593 567** to set up an appointment with someone you can truly talk to.

**commbank.com.au**

**Determined** to be different

**Important information:** Applications for finance are subject to the Bank's normal credit approval. Full terms and conditions will be included in the Bank's loan offer. Fees and charges are payable. Commonwealth Bank of Australia ABN 48 123 123 124. CBALA0605



අන්තර්ජාලයෙන් සන්නස
www.sannasa.net
හෝ
www.sannasa.com